# පුරප්පාඩු

# ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

මෙම විශ්වවිද්‍යාලයේ පුරප්පාඩුව පවතින පහත සඳහන් තනතුරු සඳහා සුදුසුකම් ඇති විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ, විශ්වවිද්‍යාලවල හා ඊට අනුබද්ධිත උසස් අධ්‍යාපන ආයතන වල සේවය තහවුරු කරන ලද ස්ථිර සේවක භවතුන්ගෙන් පමණක් අයදුම්පත් කැඳවනු ලැබේ.

අයදුම්පත් මාර්ග ගත ක්‍රමවේදය ඔස්සේ පමණක් ඉදිරිපත් කළ යුතු අතර අයදුම්පත් ඉදිරිපත් කිරීම සඳහා මාර්ගගත ද්වාරය (Online Portal) **2025.09.12 දින පෙ.ව. 08.30 සිට 2025.09.26 දින ප.ව. 4.30 දක්වා** විවෘතව පවතිනු ඇත.  වැඩි විස්තර https://www.sjp.ac.lk/vacancies වෙබ් පිටුව මගින් ලබා ගත හැකි අතර මාර්ග ගත ක්‍රමවේදය ඔස්සේ අයදුම්පත් ඉදිරිපත් කිරීම සඳහා https://hrms.sjp.ac.lk/vacancies/nonacademic/internal වෙත පිවිසිය යුතුය.

**Apply Now!**

මාර්ග ගත ක්‍රමවේදය ඔස්සේ සම්පූර්ණ කරන ලද අයදුම්පතෙහි දෘඩ පිටපතක් මෙම විශ්වවිද්‍යාලයේ නම්, අදාල අංශ ප්‍රධාන, අධ්‍යයනාංශ ප්‍රධාන, පීඨාධිපති මඟින්ද, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ/විශ්වවිද්‍යාලයක/ආයතනයක/අනුබද්ධිත විශ්වවිද්‍යාලයක/මණ්ඩපයක නම් එහි ලේකම්/ලේඛකාධිකාරී/අධ්‍යක්ෂ/ආයතන ප්‍රධානියා/මණ්ඩපාධිපති මඟින් **2025.10.03 වන දින හෝ එදිනට ප්‍රථම** ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් **නියෝජ්‍ය ලේඛකාධිකාරී, අනධ්‍යයන ආයතන අංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, ගංගොඩවිල, නුගේගොඩ**. යන ලිපිනයට එවීමට පියවර ගත යුතුය. අයදුම්පත්‍රය බහාලන ලිපි කවරයේ ඉහළ වම් කෙළවරේ අදාල තනතුර සඳහන් කරන්න.

අවශ්‍ය විස්තර සඳහන් නොකිරීම, අපැහැදිලිවීම, සුදුසුකම් සනාථ කිරීම සඳහා අදාල සහතිකවල ඡායා පිටපත් අමුණා නොතිබීම සහ අයදුම්පත් නියමිත දිනට පසුව ලැබීම හෝ වෙනයම් අවශ්‍යතාවයක් සපුරා නොතිබීම අයදුම්පත් ප්‍රතික්ෂේප කිරීමට හේතුවේ. යම් තනතුරක් සඳහා අයදුම්පත් විශාල සංඛ්‍යාවක් ලැබුණු අවස්ථාවක අවස්ථාවෝචිත ක්‍රමයක් අනුගමනය කරමින් අයදුම්කරුවන් සීමා කිරීමක් සිදු වේ. කිසියම් අයදුම්පත්‍රයක් ප්‍රතික්ෂේප කළවිට කුමන හේතුවක් නිසා හෝ යලි සලකා බලනු නොලැබේ.

### උපශාලාධිපති (පූර්ණකාලීන) II ශ්‍රේණිය – (පුරප්පාඩු 02 – ගැහැණු 01/පිරිමි 01)
### SUB-WARDEN (FULL TIME) – (GRADE II)

**සුදුසුකම් :-**

- පිළිගත් විශ්වවිද්‍යාලයක උපාධියක් හිමි අයෙකු විය යුතුය. නේවාසිකාගාර පරිපාලනය හා කළමනාකරණය පිළිබඳ අත්දැකීම් ඇති අය සඳහා ප්‍රමුඛතාවයක් ලබා දෙනු ලැබේ.

**වැටුප් පරිමාණය :- රු. 71,365 – 18×1,190 – 92,785 (මාසික) U-MN 3(II)**

(මෙයට අමතරව රජය විසින් අනුමත කරන ලද දීමනා ගෙවනු ලැබේ.)

**බඳවා ගැනීම** :- සම්මුඛ පරීක්ෂණයක් මඟින්.

### ඖෂධවේදී (පහළ ශ්‍රේණිය) – (පුරප්පාඩු 02)
### PHARMACIST (LOWER GRADE)

**සුදුසුකම් :-**

සුදුසුකම්ලත් ඖෂධවේදියෙකු ලෙස ශ්‍රී ලංකා වෛද්‍ය සභාව විසින් පිළිගත් යෝග්‍යතා සහතිකය ලබා තිබීම.

**වැටුප් පරිමාණය :- රු. 51,095-7×540; 10×640- 60,575 (මාසික) U-MT 1(III)**

(මෙයට අමතරව රජය විසින් අනුමත කරන ලද දීමනා ගෙවනු ලැබේ.)

**බඳවා ගැනීම** :- සම්මුඛ පරීක්ෂණයක් මඟින්.

### තාක්ෂණික නිලධාරී (තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය) III ශ්‍රේණිය – (පුරප්පාඩු 04)
### TECHNICAL OFFICER (ICT) – (GRADE III)

**සුදුසුකම් :-**

- අ.පො.ස. (උ/පෙළ) විභාගයෙන් ඕනෑම විෂය ධාරාවක් යටතේ එක් වරකදී විෂයයන් තුනක්  (03) සමත් ව තිබීම.

සහ

- තොරතුරු සන්නිවේදන හා බහු මාධ්‍ය තාක්ෂණය / තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය / තොරතුරු තාක්ෂණය ක්ෂේත්‍රයේ හෝ ඊට සමාන ක්ෂේත්‍රයක තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන කාර්මික / වෘත්තීය පුහුණු ආයතනයකින් හෝ පිළිගත් ආයතනයකින් නිකුත් කරන ලද ජාතික වෘත්තීය සුදුසුකමේ 5 වන මට්ටම (V.Q. Level 5) හෝ ඊට නොඅඩු මට්ටමක ප්‍රවීනතා සහතිකයක් ලබා තිබීම.

(Having obtained a certificate of proficiency not below than the N.V.Q Level 5 issued by a Technical / Vocational Training Institute accepted by the Tertiary and Vocational Education Commission or recognized Institution in the field of Information Communication and Multimedia Technology / Information and Communication Technology / Information Technology or Equivalent.)

- තොරතුරු සන්නිවේදන තාක්ෂණය පිළිබඳ සේවා පළපුරුද්ද ඇති අයදුම්කරුවන් කෙරෙහි ප්‍රමුඛතාවයක් දක්වනු ලැබේ

**සටහන :-** පාඨමාලාවට අදාළ ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම (N.V.Q. Level) තහවුරු කිරීම සඳහා තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව (Tertiary and Vocational Education Commission) මඟින් නිකුත් කරන සමානතා සහතිකයක් (Certificate of Equivalence) ඉදිරිපත් කළ යුතුය.

**වැටුප් පරිමාණය :- රු. 51,095-7×540; 10×640- 60,575 (මාසික) U-MT 1(III)**

(මෙයට අමතරව රජය විසින් අනුමත කරන ලද දීමනා ගෙවනු ලැබේ.)

**බඳවා ගැනීම** :- ලිඛිත හා/හෝ ප්‍රායෝගික පරීක්ෂණයක්  හා සම්මුඛ පරීක්ෂණයක් මඟින්.

### කළමනාකරණ සහකාර (සරප්) III ශ්‍රේණිය – (පුරප්පාඩු 01)
### MANAGEMENT ASSISTANT (SHROFF) – (GRADE III)

**සුදුසුකම් :-**

1. අ.පො.ස (සා/පෙළ) විභාගයේදී

- සිංහල භාෂාව/දෙමළ භාෂාව
- ඉංග්‍රීසි භාෂාව/ඉංග්‍රීසි සාහිත්‍යය
- ගණිතය

යන විෂයන්ට සම්මාන සාමාර්ථ සහිතව විෂයයන් 06ක් එක් වරකදී සමත් වී තිබීම.

සහ

2. අ.පො.ස (උ/පෙළ) විභාගය එක් වරකදී ගණකාධිකරණය ඇතුලුව සියලු විෂයයන් සමත් වීම. (සාමාන්‍ය පොදු පරීක්ෂණ ප්‍රශ්න පත්‍රය හැර)

පහත සඳහන් සුදුසුකම් සපුරා ඇති අය කෙරෙහි ප්‍රමුඛතාවයක් දක්වනු ලැබේ.

(අ) පිළිගත් ආයතනයකින් ලබා ගත් මාස 06 කට නොඅඩු පිළිගත හැකි පරිගණක යෙදුම් පාඨමාලාවක් හදාරා තිබීම.

සහ

(ආ) පරිගණක යෙදුම් පැකේජ භාවිතය පිළිබඳ වසර 02 ක පළපුරුද්ද

සටහන :- විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව / උසස් අධ්‍යාපන ආයතනය තීරණය කරන පරිදි ආරක්ෂක තැන්පතුවක් තැන්පත් කළ යුතුය.

**වැටුප් පරිමාණය :- රු. 49,475-17×540 – 58,655 (මාසික) U-MN 1(III)**

(මෙයට අමතරව රජය විසින් අනුමත කරන ලද දීමනා ගෙවනු ලැබේ.)

**බඳවා ගැනීම** :- ලිඛිත පරීක්ෂණයක් සහ සම්මුඛ පරීක්ෂණයක් මඟින්

**සටහන** :- ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.

මනා චරිතවත් පුද්ගලයකු විය යුතුය.

### කළමනාකරණ සහකාර (ගබඩා භාරකරු) III ශ්‍රේණිය – (පුරප්පාඩු 01)
### MANAGEMENT ASSISTANT (STORE-KEEPING) – (GRADE III)

**සුදුසුකම් :-**

1. අ.පො.ස (සා/පෙළ) විභාගයේදී

- සිංහල භාෂාව/දෙමළ භාෂාව
- ඉංග්‍රීසි භාෂාව/ඉංග්‍රීසි සාහිත්‍යය
- ගණිතය

යන විෂයන්ට සම්මාන සාමාර්ථ සහිතව විෂයයන් 06 ක් එක් වරකදී සමත් වී තිබීම.

සහ

2. අ.පො.ස (උ/පෙළ) විභාගය එක් වරකදී සියලු විෂයයන් සමත් වීම. (සාමාන්‍ය පොදු පරීක්ෂණ ප්‍රශ්න පත්‍රය හැර)

පහත සඳහන් සුදුසුකම් සපුරා ඇති අය කෙරෙහි ප්‍රමුඛතාවයක් දක්වනු ලැබේ.

(අ) පිළිගත් ආයතනයකින් ලබා ගත් මාස 06 කට නොඅඩු පිළිගත හැකි පරිගණක යෙදුම් පාඨමාලාවක් හදාරා තිබීම.

සහ

(ආ) පරිගණක යෙදුම් පැකේජ භාවිතය පිළිබඳ වසර 02 ක පළපුරුද්ද

**තනතුරට විශේෂිත වූ සුදුසුකම්**

ඉහතින් දක්වා ඇති සුදුසුකම් වලට අමතරව අයදුම්කරුවන් කළමනාකරණ සහකාර (ගබඩා භාරකරු) තනතුරට විශේෂිත වූ පහත දක්වා ඇති සුදුසුකම් සපුරාලිය යුතුය.

- ගබඩා පරිපාලනය පිළිබද වසරක පළපුරුද්ද සහ/හෝ අ.පො.ස. (සා.පෙළ) විභාගයේ දී වාණිජ්‍ය විෂය සමත්ව තිබීම හෝ අ.පො.ස. (උ.පෙළ) විභාගයේ දී ගණකාධිකරණය විෂය සමත්ව තිබීම.

සටහන :- විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව / උසස් අධ්‍යාපන ආයතනය තීරණය කරන පරිදි ආරක්ෂක තැන්පතුවක් තැන්පත් කළ යුතුය.

**වැටුප් පරිමාණය :- රු. 49,475-17×540 – 58,655 (මාසික) U-MN 1(III)**

(මෙයට අමතරව රජය විසින් අනුමත කරන ලද දීමනා ගෙවනු ලැබේ.)

**බඳවා ගැනීම** :- ලිඛිත පරීක්ෂණයක් සහ සම්මුඛ පරීක්ෂණයක් මඟින්

**සටහන** :- ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.

මනා චරිතවත් පුද්ගලයකු විය යුතුය.

### රියදුරු III ශ්‍රේණිය – (පුරප්පාඩු 08)
### DRIVER – (GRADE III)

**සුදුසුකම් :-**

- බර වාහන පැදවීමේ දක්ෂතාවය පිළිබඳ මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් විසින් නිකුත් කරන ලද බලපත්‍රයක් තිබිය යුතු අතර, බලපත්‍රය ලබා ගැනීමෙන් පසු රිය පැදවීම පිළිබඳ අවම වශයෙන් වසර 03 ක පළපුරුද්දක් තිබිය යුතුය.

සහ

- ප්‍රාථමික මට්ටමේ අර්ධ පුහුණු (U-PL 2) හෝ ප්‍රාථමික මට්ටමේ නුපුහුණු (U-PL 1) තනතුරක වසර 05 සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම සහ තනතුරෙහි තහවුරු කර තිබීම.

වැටුප් පරිමාණය :- රු**. 48,005 – 16×490 – 55,845 (මාසික) U-PL 3(III)**

(මෙයට අමතරව රජය විසින් අනුමත කරන ලද දීමනා ගෙවනු ලැබේ.)

**බඳවා ගැනීම** :- වෘත්තීය පරීක්ෂණයක් හා  ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මඟින්.

### විද්‍යාගාර සහායක (III ශ්‍රේණිය) – (පුරප්පාඩු 16)
### LABORATORY ATTENDANT – (GRADE III)

**සුදුසුකම් :**

1. වර්තමාන තනතුරේ සේවය තහවුරු කර ඇති ප්‍රාථමික මට්ටමේ නුපුහුණු (U-PL 1) තනතුරක සේවය කරන පහත සුදුසුකම් සපුරා ඇති සේවකයින්.

(අ) අ.පො.ස. (සා/පෙළ) විභාගය අවම වශයෙන් සම්මාන සාමාර්ථ (C) දෙකක් සහිතව වාර දෙකකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් සමත් වී තිබීම සහ විද්‍යාගාර සහායක කාර්යයට අදාළ තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් කාර්මික/වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරන ලද ජාතික වෘත්තීය සුදුසුකමේ N.V.Q. 2 හෝ 3 මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

හෝ

(ආ) අ.පො.ස. (සා/පෙළ) විභාගය අවම වශයෙන් සම්මාන සාමාර්ථ (C) දෙකක් සහිතව වාර දෙකකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් සමත්වී තිබීම සහ අදාල විෂය ක්ෂේත්‍රයේ වසරක (01) සේවා පළපුරුද්දක් ලබා තිබීම.

හෝ

2. වර්තමාන තනතුරේ සේවය තහවුරු කර ඇති ප්‍රාථමික මට්ටමේ නුපුහුණු (U-PL 1) තනතුරක සේවය කරන හා කාර්මික කුසලතා සහිත තනතුරට අදාළව අවමය වසර පහක (05) සේවා කාලයක් සම්පූර්ණ කර ඇති සේවකයින්.

සටහන**:** පාඨමාලාවට අදාළ ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම (N.V.Q. Level)  තහවුරු කිරීම සඳහා තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව (Tertiary and Vocational Education Commission) මඟින් නිකුත් කරන සමානතා සහතිකයක් (Certificate of Equivalence) ඉදිරිපත් කළ යුතුය.

**වෙනත්:**

1. ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.
2. තනතුරේ රාජකාරී හොඳින් ඉටු කිරීමට සහ දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට ශාරීරිකව හා මානසිකව සුදුසු විය යුතුය.

- මනා චරිතවත් පුද්ගලයෙකු විය යුතුය.

**වැටුප් පරිමාණය :- රු. 44,575 – 16×490 – 52,415 (මාසික) U-PL 2(III)**

(මෙයට අමතරව රජය විසින් අනුමත කරන ලද දීමනා ගෙවනු ලැබේ.)

**බඳවා ගැනීම** :- වෘත්තීය පරීක්ෂණයක් හා සම්මුඛ පරීක්ෂණයක් මඟින්.

**ඒ.බී. වැලිවිට**
ලේඛකාධිකාරී